**රජයේ නිවේදන**

**සුරාබදු ආඥාපනත**

**අංක 02/2025 දරන සුරාබදු නිවේදනය**

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වන වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව 2025 වසරේ ඔක්තෝබර් මස 22 දින පාර්ලිමේන්තුවේ යෝජනාවක් මඟින් ස්ථිර කරන ලද රීති.

මෙම රීති 2025 ඔක්තෝබර් මස 28 වැනි දින සිට බලපැවැත්වේ.

අනුර කුමාර දිසානායක
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2025 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**මත්පැන් නිෂ්පාදනය මත බදු ගෙවීමේ කාලසීමාව සහ ගාස්තු අය කිරීම සඳහා අදාළ වන රීති**

1. සෑම බලපත්‍රලාභියෙකුම, (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වන වගන්තිය යටතේ කලින් කලට තීරණය කර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලබන අනුපාතයන්ට අනුව, එම බලපත්‍රලාභියා විසින් නිෂ්පාදනය කරනු ලබන සෑම මත්පැන් ලීටරයක් මත, නියමිත දිනට හෝ එදිනට පෙර බද්දක් ගෙවිය යුතුය.

2. බද්ද ගෙවීමට නියමිත දිනය:

   අ) මාසයක පළමු දින පහළොව (15) තුළ මත්පැන් නිෂ්පාදනය සම්බන්ධයෙන්, එම මාසයේ අවසාන දිනය ද;

   ආ) මාසයක දහසයවන (16) දින සිට එම මාසයේ අවසාන දිනය දක්වා කාලය තුළ මත්පැන් නිෂ්පාදනය සම්බන්ධයෙන්, ඊළඟ මාසයේ පහළොස්වන (15) දිනය ද විය යුතුය.

3. නියමිත දින වනවිට බද්ද ගෙවීමට බලපත්‍රලාභියෙකු අපොහොසත් වූ විට, ගෙවිය යුතු බද්දට අමතරව, එම ගෙවිය යුතු බද්ද මත සරල මාර්ග ක්‍රමය අනුව ගණනය කරනු ලබන මසකට සියයට තුනක (3%) ගාස්තුවක් ගෙවීමට එම බලපත්‍රලාභියා බැඳී සිටිය යුතුය.

4. නියමිත දින සිට දින තිහක් (30) ඇතුළත ගෙවිය යුතු බද්ද හා ගාස්තුව සම්පූර්ණයෙන් ගෙවීමට අපොහොසත් වන බලපත්‍රලාභියෙකුගේ බෝතල් කිරීමේ බලපත්‍රය (බී1) අත්හිටුවීමට යටත් විය යුතුය.

5. නියමිත දින සිට දින අනූවක් (90) ඉක්මවන කාලයක් සඳහා ගෙවිය යුතු බද්ද හා ගාස්තුව සම්පූර්ණයෙන් නොගෙවා ඇති විට, එම බලපත්‍රලාභියාගේ සියලුම බලපත්‍ර අත්හිටුවීමට යටත් විය යුතුය.

6. බද්ද ගෙවීම සඳහා නියමිත වූ දිනය, මෙම රීති බලපැවැත්වෙන දිනට පෙර දිනයක් වූ විට, පිළිවෙලින් 4 වන සහ 5 වන රීති මඟින් දක්වා ඇති දින තිහක් (30) සහ දින අනූවක (90) කාලපරිච්ඡේද මෙම රීති ක්‍රියාත්මක වන දින සිට ගණනය කළ යුතුය.

7. 2014 ජනවාරි 20 දිනැති අංක 1846/8 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අංක 962 දරන සුරාබදු නිවේදනය මෙම රීති බලපැවැත්වීමත් සමඟ අවලංගු වේ.